## නිපුණතා මට්ටම 1.4 : වේදිකා නාට්‍යයෙහි විශේෂතා

https://youtu.be/wBh0uljLNm0

https://youtu.be/wJ2Mi09hGuI

https://youtu.be/LPRGYExdwZI

නාට්‍ය නැරඹීමෙන් රසාස්වාදය, ජීවිතාවබෝධය පමණක් නොව නාට්‍ය කලාව පිළිබඳව පුළුල් අවබෝධයක් ද ලැබේ. රූපවාහිනියෙන් හෝ වීඩියෝපට මගින් වේදිකා නාට්‍ය නැරඹීම සාර්ථක නොවන්නේ වේදිකා නාට්‍යය යනු සජීවී අද්දැකීමක් වන බැවිනි. එක් වරක් වත් වේදිකාවක් මත නාට්‍යයක් සජීවී ව දැකීමෙන් එහි ආලෝක සැපසීම, පසුතල මාරු කිරීම, අංග රචනය සිදු කර ඇති අන්දම, රංග වස්ත්‍රවල ඇති විශේෂත්වය, රංගෝපකරණ භාවිත වන ආකාරය, වේදිකා පරිපාලකගේ කාර්ය භාරය, සජීවී ලෙස සංගීත සපයන ආකාරය, අධ්‍යක්ෂණ ක්‍රියාවලියේ සාර්ථක අසාර්ථක තත්ත්වයන් ආදිය පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීමට හැකි ය.

"නාට්‍යය යනු බොහෝ කලා ශිල්පීන් ගේ සාමූහික ප්‍රයත්නයක මනා ප්‍රතිඵලයකි" විමසන්න.
(ඔබ නැරඹූ නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ශිල්පීන් හා ඔවුන් ගේ කාර්යභාරය කෙරෙහි අවධානය යොමු කරන්න.

- පෙළ රචක, නිෂ්පාදක, පාත්‍ර වර්ගයා
- වෙස් සැලසුම්කරු
- පසුතල නිර්මාණ
- පෙළ මතක් කරන්නාඃෂරදපචඑදර*
- ආලෝක ශිල්පීන්
- අංග රචනා ශිල්පී
- සංගීතඥයා

ආනුශංගික ශිල්පීන් රැසක් සහභාගී වේ. වේශ භූෂණ ශිල්පියා රංග වස්ත්‍ර නිර්මාණය කර දෙන අතර රංග භූමි අලංකරණ ශිල්පියා රංග පසුතලය තනා දෙයි. එමෙන් ම රංගෝපකරණ තනා දෙයි. සංගීත නිර්මාණ ශිල්පියා නාට්‍යයට අවශ්‍ය සංගීතය නිර්මාණය කරයි. රංග වින්‍යාස අධ්‍යක්ෂවරයා නාට්‍යයේ රිද්මයානුකූල චලන සකසා දෙයි. අංගරචනය කිරීම භාර වන්නේ අංගරචන ශිල්පියාට ය. රංගාලෝකය සපයා දෙන්නේ රංගාලෝක ශිල්පීන් ය.














